මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) - 11 - 2449823
වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PF/FS/01/XXXV
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 24.04.2008

**Public Finance Circular No. 431**

Secretaries of Ministries,
Chief Secretaries of Provincials Councils,
Heads of Departments,
District Secretaries,
Chairmen of State Corporations, State Banks, Statutory Boards and Government Owned Companies
Heads of Local Government Institutions,

## PURCHASE OF AIRLINE TICKETS TO TRAVEL ABROAD

All officers travelling abroad on official purpose ie. for discussions, seminars, training programmes etc. are required to purchase their airline tickets from SriLankan Airlines or Mihin Lanka with immediate effect, irrespective of the source of financing of such travel.

02. In the event an officer is required to travel to a destination where SriLankan Airlines or Mihin Lanka do not fly, best endevours should be made to travel at least a part of such journey with SriLankan Airlines or Mihin Lanka However, an officer may fly with another airline with the approval of the Secretary to the relevant line ministry, if it would result in a substantial reduction of associated costs to the Government or would result in a substantial reduction of the flying time or due to non availability of seats or the SriLankan Airlines or Mihin Lanka do not fly at all in that route.

03. Please note that purchasing of airline tickets and planning of air travel should be done through either B.O.C.Travels (Pvt) Limited or People's Travels (Pvt) Limited which are fully owned subsidiaries of State Banks.

Contd.. 2..

04. These instructions will apply in place of the provisions relating to purchase of airline tickets contained in Circular No. MF6/1/3/2000 dated 27.03.2000 on "Release of Foreign Exchange for Travel Abroad" issued by the Ministry of Finance and Planning.

05. Should you need any further clarification you may Please contact any one of the following officers attached to the Public Finance Department of the General Treasury.

Mr. N.M.D. Nawarathne,
Deputy Director (Tel: 011-2484632) (Fax: 011-2431458)

Mr. C. Jayasuriya,
Assistant Director (Tel: 011- 2484634) (Fax: 011- 2431458)

**P.B. Jayasundera**
**Secretary to the Treasury**

Copies: 1. Chairman, SriLankan Airlines Limited.
2. CEO, Mihin Lanka (Pvt) Ltd.
3. Chairman, Bank of Ceylon.
4. Chairman, Peoples Bank.
5. Chief Executive Officer, BOC Travels (Private) Ltd.
✓ 6. Chief Executive Officer, People's Travels (Private) Ltd.
7. Auditor General.

To consider giving best possible discounts and priority for Official travels.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) - 11 - 2449823
වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PF/FS/01/XXXV
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2008.04.24

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක : 431

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා, රාජ්‍ය බැංකු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා
රජය සතු සමාගම් වල සභාපතිවරුන් සහ
පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් වෙත

<u>විදේශ ගමන් සඳහා යානාපත්‍ර මිළදී ගැනීම</u>

සාකච්ඡා, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් ඇතුළු සියලු රාජකාරි ගමන් සඳහා විදේශ ගත වන සියලුම නිලධාරීන්, කුමන අරමුදල් වලින් වියදම් දැරුවද, මින් ඉදිරියට සිය ගුවන් ගමන් යානා පත්‍ර ශ්‍රීලංකන් එයාර්ලයින් සමාගම හෝ මිහින් ලංකා (පුද්ගලික) සමාගම වෙතින් පමණක් මිළදී ගත යුතු බව කාරුණිකව දන්වමි. සියලුම නිලධාරීන් මේ පිළිබඳව දැනුවත් කර යානා පත්‍ර එම සමාගම වෙතින් කල්වේලා ඇතිව වෙන් කර ගැනීමට හැකිවන පරිදි තම විදේශ ගමන් සැලසුම් කර ගන්නා ලෙස උපදෙස් ලබාදීම මැනවි.

02. කිසියම් නිලධාරියෙකු හට එම ගුවන් සමාගම් විසින් ගුවන් ගමන් සේවා සපයනු නොලබන ගමනාන්තයක් කරා ගමන් කල යුතු අවස්ථාවකදී යටත් පිරිසෙයින් එම ගුවන් ගමනෙහි කොටසක් සඳහා හෝ එම සමාගම් විසින් සපයන සේවාවන් උපයෝගීකර ගැනීමට ඇති හැකියාව විමසා බැලිය යුතු වේ. එසේ වුවද රජයට දැරීමට සිදුවන වැය බර සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු ගර ගත හැකි බව පෙනී යන අවස්ථාවකදී හෝ ගුවන් ගමන් සඳහා ගතවන කාලය සැලකිය යුතු පරිදි අඩු කර ගතහැකි අවස්ථාවකදී හෝ අවශ්‍ය ගමන සඳහා ආසන වෙන් කර දීමට ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගමට හෝ මිහින් ලංකා (පුද්ගලික) සමාගමට අපහසු වන අවස්ථාවකදී හෝ ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගම හෝ මිහින් ලංකා (පුද්ගලික) සමාගම විසින් ගමන් පහසුකම් සපයනු නොලබන ගමනාන්තයක් වෙත යැමට සිදුවන අවස්ථාවකදී හෝ පමණක් අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය යටතේ වෙනත් ගුවන් සේවා සමාගම් මගින් ගමන් පහසුව සලසා ගැනීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැත.

03. යානා පත්‍ර මිලදී ගැනීමේ සහ ගුවන් ගමන් සංවිධානය කිරීමේ කටයුතු රාජ්‍ය බැංකු යටතේ පාලිත සමාගම් වන බී.ඕ.සී. ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හා පිපල්ස් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් මගින් ඉටු කර ගත යුතු බවද කරුණාවෙන් සලකන්න.

04. විදේශ ගමන් සඳහා විදේශ විනිමය මුදා හැරීම සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් 2000.03.27 වන දින නිකුත් කරන ලද අංක : එම්එෆ්6/1/3/2000 දරණ චක්‍රලේඛයේ ඇතුළත් <u>යානා පත්‍ර මිළදී ගැනීම සම්බන්ධයෙන්</u> වූ උපදෙස් වෙනුවට මෙම උපදෙස් නිකුත් කරනු ලැබේ.

05. මේ පිළිබඳව කිසියම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ පහත සඳහන් නිලධාරීන් කරුණාකර අමතනු මැනවි.

නියෝජ්‍ය අධ්‍යක්ෂ, එන්.එම්.ඩී. නවරත්න මහතා - දුරකථන. 011- 2484632
ෆැක්ස් 011- 2431458

සහකාර අධ්‍යක්ෂ, සී.ජයසූරිය මහතා - දුරකථන. 011- 2484634
ෆැක්ස් 011- 2431458

පී.බී.ජයසුන්දර

භාණ්ඩාගාරයේ ලේකම්.

පිටපත් :
1. සභාපති, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්
2. ප්‍රධාන විධායක නිලධාරී,මිහින් ලංකා (පුද්ගලික) සමාගම
3. සභාපති, ලංකා බැංකුව
4. සභාපති, මහජන බැංකුව
5. ප්‍රධාන විධායක නිලධාරී, බී.ඕ.සී.ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
6. ප්‍රධාන විධායක නිලධාරී, පිපල්ස් ට්‍රැවල්ස්.(ප්‍රයිවට්) ලිමිටඩ්

} රාජකාරී ගමන් වෙනුවෙන් රාජ්‍ය ආයතනයන්ට උපරිම සේවාව ලබාදීමට හා ආසන වෙන් කිරීමේදී ප්‍රමුඛත්වය ලබාදීම සඳහා.

7. විගණකාධිපති.